# අහිගුණ්ඨික ජන සංස්කෘතිය හා ගාඩි ජනවහර (සමාජ මානව විද්‍යාත්මක පර්යේෂණයකි)

*වසන්ත කේ. දිසානායක* [1]

***ABSTRACT***

***Sri Lankan Gypsies are not the indigenous Sri Lankan. They are a group of people which have recognition in tradition, tribes and ethnicity. Gypsies have been perennially regarded as nomads as they have no fixed abode and they travel from place to place as frequently as in seven day intervals. So this tiny race did not have permanent dwellings. Since the world is gradually changing many families belonging to this group have diminished in number. Most gypsy families are now extinct and minority gypsies are still living in many Asian countries, including Sri Lanka, and the South India. They came to Sri Lanka through the western coast of the country and made their new settlement close to Kalawewa in villages such as Galgamuwa, Nochchiyagama, Mihintale, Puliyankulama, Vijithapura, Kagama, Kekirawa etc……………………***

***The village which was selected for this study is called " Kudagama" that is closer to Thambuththegama comprises of traditional gypsy features. Gypsies traditional communication system was buried with the present communication. Although Sri Lankan gypsies are not an ancient Sri Lankan traditional community group, they are a group of people presently established in Sri Lankan society.The gypsy reserved their traditional social rites and rituals up today due to the continuation of the social and cultural gap. The gypsies think that there is a social gap between majority Sinhala society and them. Due to this social gap they have persevered their traditional rites and rituals up today. They survive as they have done for centuries by reading palms, snake charming and training monkeys to perform tricks. There is a little doubt that gypsies are gradually changing as a result of evolving economic and social factors, although the change cannot be marked as a radical change towards total social and economic integration.***

---

[1] **Dr.D.M Wasanta K Dissanayaka, Senior Lecturer, BA(Hons.)in Sinhala,(PDN) M.phil in Sinhala (PDN) Ph.D in World Literature (University of Nanjin Normal University,P.R. of China) Head,Department of Humanities .E-mail: dwasanta@yahoo.com**

## හැඳින්වීම (Introduction)

ශ්‍රී ලාංකේය ප්‍රාථමික ජන සමාජ (සෝමසුන්දර සහ මාදන බණ්ඩාර, 2009) හා ජන සංස්කෘතිය (Tylor : 1929) නිවැරැදිව හඳුනාගැනීමේ දී දැනට ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රාථමික ජන කණ්ඩායම් වන වැදි, රොඩී, කින්නර, අහිගුණ්ඨික හෙවත් ගාඩි ජන කණ්ඩායම් පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වූවකි. ඒ අතර විදේශීය ප්‍රභවයක් ඇති අහිගුණ්ඨික හෙවත් ගාඩි (බණ්ඩාර සහ තවත් අය, 2007) ජනයා ශ්‍රී ලාංකේය ප්‍රභවයක් ඇති රොඩී, කින්නර, වැදි ආදී වූ ජන කොට්ඨාස හා සම සමව එහෙත් ඔවුනටම ආවේණික වූ අනන්‍ය සාධාරණ ජන සංස්කෘතියකට උරුමකම් කියන ජන කොටසක් බව පළමුකොටම පෙන්වා දිය යුතුය.

"ගුණ්ඨික" යනු "සර්පයන් නටවන්නා" යන අර්ථය ජනනය කරයි (සෝරත,1963:120)."තුණ්ඩික" යනු අහිගුණ්ඩිකයාට තවත් නමකි (සෝරත,120). 'නයියඩි' යනු ද මෙකී ජන වර්ගයා සඳහාම යෙදෙන්නකි. නයිආඩි යන්න "නයියඩි" නයියණ්ඩි වශයෙන් භාවිත වන බව සැලකිය හැකිය. 'අහිතුණ්ඨික' යන සංස්කෘත පදයෙහි අර්ථය "නයිමුණා" වන අතර අහිගුණ්ඨික යන පාළි පදයෙහි අරුත "සර්ප ගැටයා", "නයි ගැටයා" යන්නයි. උගුල් ඇටවීම, වෙළීම යන අරුත් දෙන "ගුණ්ය" යන සංස්කෘත ධාතුවෙන් "ගුණ්ය" යන්නත් සර්පයා යන අරුත්දෙන "අහි" යන්නත් එකතු වීමෙන් 'අහිගුණ්ඨික' යන්න සකස් වූ බවත් ගී කීම, ගීයෙන් වසී කිරීම යන අරුත් දෙන සංස්කෘත "ගුණ්ඩි" වෙතුවෙන් ගුණ්ඩික යන්න සකස් වී ඇති බවත් තුඩ (චෛත්‍ය) යන අරුත් සපයන 'තුණ්ඩ' යන සංස්කෘත ධාතුවෙන් උපන් "තුණ්ඩක" යන්නත් එකතු වී මෙම "අහිතුණ්ඨික", "අහිගුණ්ඨික", "අහිතුණ්ඨික" යන නාම සකස් වන්නට ඇතැයි විද්වත් ඇතැමුන්ගේ මතයයි. අහිගුණ්ඨිකයන් ඉංග්‍රීසි භාෂාවෙහි හැඳින්වෙන්නේ ජිප්සීස් (Gypsies) නාමයෙනි. " a member of a race of people originally from Asia who travel around and traditionally live in caravans many people prefer to use the name Romany see also Romany compare traveller." (රණසිංහ, 1972).

නිසි අරමුණකින් විනිර්මුක්තව සංචාරය කරන අහිගුණ්ඨිකයෝ නයි, වඳුරන් හා රිලවුන් නටවමින් ගී ගයමින් පිරිස් මැදට ගොස් ඔවුන්ගෙන් මුදල් ලබා එදිනෙදා ජීවිතය ගත කරති. අහිගුණ්ඨිකයන් සිංහල හා ද්‍රවිඩ නොවන එනමුත් එකී ජනවර්ග ද්විත්වයට මැදි වූ අන්තර්වර්තීය ජන ප්‍රභවයක් ලෙස සැලකිය හැකිය. ඔවුහු ඔවුන්ටම අනන්‍ය සාධාරණ සංස්කෘතියකට හා ඉතා මැනවින් සංවිධානය වූ සමාජ සංස්ථාවකට උරුමකම් කියති. උක්ත සංස්කෘතිය විනිවිද දැකිය හැකි මෙවලම වන්නේ ඔවුන් වහරන භාෂාවයි. අහිගුණ්ඨිකයන්ගේ භාෂාව අධ්‍යයනය හා විවරණය තුළින් තත් ජනයාගේ අනන්‍යසාධාරණ සංස්කෘතිය මතුකරගැනීම උගහට නොවේ.

අහිගුණ්ඨිකයන් රටපුරා සැරිසරමින් සංචාරක දිවියක් ගෙවන නමුත් වර්තමානයේ මෙම ජන කණ්ඩායම් ස්ථිර පදිංචි ස්ථාන ලෙස හඳුනාගත හැක්කේ තඹුත්තේගම, ගල්ගමුව, නොච්චියාගම, මිහින්තලය, පුලියන්කුලම, විජිතපුර, කාගම, අන්දරබැද්ද, කරච්චිකුලම, කැකිරාව, කලාවැව, තිරුක්කෝවිල්, නාච්චාදූව, මඩකලපුව හා කරඩිකුලම් ආදි ප්‍රදේශයන්ය. එළිමහන් සහිත තැනිතලා උෂ්ණ ප්‍රදේශවලට ප්‍රිය කිරීම මොවුන්ගේ විශේෂ ලක්ෂණයකි.

## ක්‍රමවේදය (Methodology)

මෙහිදී මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මූලික ක්‍රමවේදය විය. නුවරකලාවියට අයත් තඹුත්තේගම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම්ව පවුල් 300කින් පමණ සමන්විත වූ "කුඩාගම" නම් වූ තෙළිඟු ග්‍රාමය අපගේ පර්යේෂණ ක්ෂේත්‍රයයි. එහිදී සහභාගීත්ව නිරීක්ෂණය ප්‍රධාන දත්ත සම්පාදන ක්‍රමවේදය විය.

## අහිගුණ්ඨික ජනයාගේ ප්‍රභවය හා විකාශනය

ලොව පුරා වාසය කරනු ලබන අහිගුණ්ඨික ජනයා ගේ ප්‍රභවය භාරතය හා සම්බන්ධව පවතින බවත් පසුව ඔවුන් ලොව පුරා පැතිරී ගිය බවත් වාග්විද්‍යාත්මක හා ඓතිහාසික සාධක උපයෝගී කරගනිමින් ඇතැම් සමාජ මානව විද්‍යාඥයෝ කරුණු දක්වති.

දේශ දේශාන්තරවල සංචාරය කරමින් ජීවත්වන මොවුන්ගෙන් බහුතරයක් වාසය කරන්නේ යුරෝපයේය. අහිගුණ්ඨික ජනයාට ලිඛිත ඉතිහාසයක් නොමැති වීමත් විවිධ ජාතීන් හා සම්මිශ්‍රණය වීමත් නිසා ඔවුන්ගේ සත්‍ය ඉතිහාසය දැනගැනීම උගහට වී ඇත. එනමුත් මොවුන්ගේ ප්‍රභවය හා ඉතිහාසය පිළිබඳව ගොඩනැඟී ඇති විවිධ ජනප්‍රවාද, ජනකතා ආදිය මඟින් යම් තරමක ඉතිහාසයක් ගොඩනඟාගත හැකිවීම භාග්‍යයකි.

භාරතය නිජභූමිය කොට සිටි අහිගුණ්ඨික ජනයාගේ ප්‍රභවය පිළිබඳ කාලය ගැටලු සහගතය. කෙසේ නමුත් මොවුන් ක්‍රි: පූ: 6 වන සියවසටත් පෙර සිට ජීවත් වූ පිරිසක් බවට සාක්ෂි බෞද්ධ සාහිත්‍ය තුළින් අනාවරණය වේ. බුදුන් වහන්සේ දීඝ නිකායේ "බ්‍රහ්මජාල සූත්‍රයේ දී" තම ශ්‍රාවකයන් විසින් නොකළ යුතු මිථ්‍යා ආජීවයක් ලෙස නයි නැටවීම පෙන්වා දීමෙන් ඒ බැව් මැනවින් පැහැදිලි වේ.

භාරතීය ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් පරිදි මොවුහු අපරික්ෂාකාරී, කම්මැලි, අපිරිසිදු, ප්‍රීතිමත් පිරිසක් වෙති. එමෙන්ම ලෝහ හා බෙලෙක් කර්මාන්තයන්හි දක්ෂයෝය. සංගීතඥයන් හා නැට්ටුවන් ද ඒ අතර වෙති. ඔවුන්ගේ සිරුරු දීප්තිමත් ඇඳුම්වලින් හා ආභරණවලින් සරසා ගෙන

සිටින අතර පුරුෂ පක්ෂය කපටි අශ්ව වෙළඳුන් බවත් ස්ත්‍රීන් ශාස්ත්‍ර කීමෙහි නියුතු වූවන් බව බෂාම් වැඩි දුරටත් සඳහන් කරයි (බෂාම් 1965:364)

12වන සියවසෙහි දී උත්තර භාරතයේ සිට යුරෝපීය රටවලට සංක්‍රමණය වූ මෙම පිරිස් වත්මන් හින්දි භාෂාවේ ආදි ප්‍රාකෘත ස්වරූපයකට නෑකම් කියන භාෂාවක් වහරන බව වාග් විද්‍යාඥයෝ අදහස් කරති. ඔවුනගේ බස "රෝමානි " නොහොත් 'ජිප්සි' නමින් හැඳින්වේ. මෙකී ජනයාගේ ජන ජීවිතය හා රැකියා පිළිබඳවත් නොයෙක් කතා පුවත් ඒ ඒ රටවල සාහිත්‍ය තුළ ගැබ්ව පවතී.

## ශ්‍රී ලාංකේය අහිගුණ්ඨික ජනයාගේ ප්‍රභවය හා විකාශනය

ලාංකේය අහිගුණ්ඨිකයන්ගේ ගෝත්‍රාරම්භය පිළිබඳ කතාව භූරිදත්ත ජාතකය (පන්සියපනස් ජාතකය, 2007:1022) හා සම්බන්ධ වේ. සීල පාරමිතාව හුවා දැක්වෙන උක්ත ජාතක කතා පුවතට අනුව අහිගුණ්ඨිකයන් බෞද්ධයන් බවට පත් වූ අතර ආලම්බායන බමුණා බෝසතුන්ට වද දීම නිසා අහිගුණ්ඨිකයන් බවට පත් වී සසර වසන තුරු සැරිසරමින් ජීවත් වන්නට සිදු වූ බව එහි වැඩිදුරටත් සඳහන් වේ. සිංහල වන්නම් සාහිත්‍යයේ 'නයියඩි වන්නම'ට තේමාවී ඇත්තේද මෙකී කතා පුවතයි.

ඉපිද එ බෝසත් නා ලොව වාරෙක
පැහැද රකිති සිල් නර ලොව වනයක
බොවද දෙමින් අල්ලා අහිකුණ්ඨික
පැසද ලමින් නටවා දුක්දී නෙක
(නයියඩි වන්නම)

සිංහලයේ අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නායක්කර් වංශික ආන්ද්‍රා වැසියෙකි. නීතිඥ ජෝන් ද සිල්වා ශ්‍රී වික්‍රම නාට්‍යයේ දී මේ පිළිබඳ සඳහන් කර ඇත.

'ඇහැලේපොළ : අහෝ කෝල හලා රටේ එන්න සැදි සැදී
බෝ දනෝ කෝප වී මෙදා ඉන්නා හු රාජා
අණ්ඩර වංශයේ වල් කෲර රාජාගේ බලේ
බින්ද දමා මාගේ ආණ්ඩු කරනෙම් ලකේ
(ආරියරත්න,1992 : 53)

ඈත අතීතයේ සිටම ආන්ද්‍ර දේශය හා සිංහල රාජ්‍යය අතර නොයෙකුත් දේශපාලන, ආර්ථික, සාමාජික, සංස්කෘතික මෙන්ම ආගමික සම්බන්ධතා වූ බවට සාධක පවතී. එමෙන්ම තෙලිගු ජනයා පිළිබඳ නොයෙක් තොරතුරු සිංහල සාහිත්‍ය කෘති තුළ අන්තර්ගතව ඇත. කෝට්ටේ යුගයේ රචිත ගිරා සංදේශයෙහි ද මෙසේ සඳහන් වේ.

''සොලි පාඬි ළාට රට
ගුජර තුළුවර මහ රට
තෙලිඟු වගු රට සිට
පැමිණි දන මත තමන්ගේ රට''
(කුමාරතුංග, 2002, 174)

කුන්ස්තන්තිනු හටන (එඩ්වින්, 1938:51) අඬිමාලය, පුරාණ සිව්පද කතුර, වඩිග පටුන, මඟින්ද තෙලිඟු ජනයා පිළිබඳ ලාංකේය ඉතිහාසය අවබෝධකර ගත හැකිය.

ලාංකේය අහිකුණ්ඨක ජනයාගේ ප්‍රභවය හා මුල් භූමි පිළිබඳව දැනට මෙරට වැසි අහිගුණ්ඨිකයින්ගේ මතය ඉතා වැදගත් වේ. කුඩාගම වරිගනායක නාඩරාජා පවසන්නේ ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ සුදු එළහරක් මෙරටට ගෙනත් විකුණා ජීවත් වූ අතීත මුතුන් මිත්තන් මන්නාරමට පැමිණි අවස්ථාවකදී එකල රජතුමා ඔවුනට ආපසු යෑමට තහනම් කළ හෙයින් එදා සිට මෙරට වාසය ආරම්භ කළ බවයි. එතැන් පටන් සංචාරක දිවියකට හුරු වූ පුරුෂයන් වඳුරන්, රිලවුන්, නයින් පොළඟුන් වැනි සතුන් නටවමින් හා දඩයම් කරමින්ද ස්ත්‍රීන් අත බලා ශාස්ත්‍ර කියමින්ද ජීවත් වූ බව නාඩරාජාගේ අදහසයි (නාඩරාජා : 2009).

සංචාරක දිවිපෙවතක් ගත කරන මොවුන් හට මුල දී ලංකාවේ ස්ථිර වාසස්ථාන නොවූ බව රැහේ නායක නාඩරාජාගේ අදහසයි. බූරුවන් මත බඩු පටවාගෙන තැනින් තැනට ගමන් කරමින් ජංගම ජීවිතයකට කැප වූ අහිගුණ්ඨිකයෝ තමා හා තම සතුන් ආරක්ෂා කිරීමට නාගයාගේ නිවහන යන අරුත් ඇති 'ආඬි නා ඉල්ල' නාමයෙන් හඳුන්වන දිගින් අඩි 9ක් ද උසින් අඩි 5ටද වඩා වැඩි නොවූ තාවකාලික තල් අතු වාඩි තනා ගනු ලබමින් ජීවත් වූහ.

එනමුත් 1984 වසරේ දී වවුනියා ප්‍රදේශයේ වූ ඇම්. මුත්තුසාමි නම් රැහේ නායකයා පවුල් 24ක් සමඟ පැමිණ තඹුත්තේගම නල්ලච්චිය අසල 'කුඩා කුඹුක් වැව' නම් ග්‍රාමයේ ස්ථිර වාසස්ථාන ආරම්භ කළේය. ඔහු පළමුව තම පිරිවර සමඟින් නල්ලච්චියා වැව් ඉස්මත්තේ තාවකාලික වාඩිලා පසුව කුඹුක්වැව අසල ස්ථිර වාඩි ලා වැව් දියෙන් ගොවිතැන් කොට ජීවත් වීමට ක්‍රියා කළේය. මේ මඟින් අනාවරණය වන එක් ප්‍රධාන කරුණක් නම් වෙනස්වන සමාජ ආර්ථික රටාවන් හමුවේ අහිගුණ්ඨිකයින්ගේ සංස්කෘතික අනන්‍යතාවන් ද කිසියම් ලෙසකට විපර්යාසයකට ලක්ව ඇති බවයි.

විශේෂත්වය වන්නේ කෘෂි කර්මාන්තයට හුරු වුවද ඔවුන්ගේ සාම්ප්‍රදායික රැකියාවන්හි දිගටම නියැළී සිටීමයි. අප අධ්‍යයනයට ලක් කළ කුඩාගම අහිගුණ්ඨික ගම්මානය ලංකාවේ අනෙකුත් අහිගුණ්ඨිකයන් නොවිඳින වරප්‍රසාද රැසක් හිමි කරගත් ගම්මානයකි. ඔවුන් මහා

සංස්කෘතියට කළ බලපෑම නිසා මෙවැනි තත්ත්වයක් උදා වී ඇති අතර ඒ මඟින් ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව ශීඝ්‍රයෙන් වියැකෙමින් පවතින බවද කිව යුතුය. මොවුහු අතීතයේ දී පහත් ගති සිරිත් විරිත් ඇති ම්ලේච්ඡ සහගත අපිරිසිදු පිරිසක් වූ හෙයින් 'කුතාංඩි' නමින් අමතා කොන් කර තැබුවද ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවන රටාව, ඇඳුම් පැලඳුම් හා කතාබහ නොවන්නට වර්තමානයේ දී සිංහල ජනයා හා සමව සිටීමට තරම් සදාචාර සම්පන්න වීමට උත්සුක වී ඇත්තාහ.

## තෙලිගු ජනවහර

සිංහලේ මහා සමාජය තුළ කුඩා ජන කණ්ඩායමක් ලෙසින් ජීවත්වන අහිගුණ්ඨික ජනයාගේ අනන්‍යතාව තහවුරු වන ප්‍රධාන සාධකයක් වන්නේ ඔවුන් වහරන භාෂාවයි. ඒ මඟින් ඔවුන්ගේ මූලය සොයා ගැනීමටත් ඔවුන් සතු අනන්‍යතාව හඳුනාගැනීමටත් අපට හැකිවේ (රණසිංහ : 2003). ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ භාවිත වූ තෙලිගු වහරට නෑකම් කියන ලංකාවේ සිටින අහිගුණ්ඨිකයන්ගේ භාෂාව අනාර්ය භාෂාවක් ලෙස සලකනු ලබයි. ඉන්දියාවේ සිටි අනෙකුත් අහිගුණ්ඨිකයෝ භාෂා භාවිතයේ ද්විත්ව රටා වූ භාෂණය හා ලේඛනය දැන සිටියත් ලාංකේය තත් ජනයෝ කථන වහරට පමණක් උරුමකම් කියති. තම මුතුන් මිත්තන් ලේඛනය දැන සිටියත් භාවිතය සීමා සහිත වී වියැකී යන්නට ඇතැයි ඔවුහු කල්පනා කරති. ද්‍රවිඩ භාෂා රටාව සිහිගන්වන මොවුන්ගේ භාෂාවේ උච්චාරණය විශේෂ වූවකි.

ලාංකේය අහිගුණ්ඨිකයන් ජිප්සිවරුන් හා වෘත්තීය සමානත්වයක් දැක්වූවද ඔවුන් වහරන බස තෙලිගු බසට සමීප සම්බන්ධයක් දක්වන බැවින් මොවුන් 'කුරවර්' හෙවත් 'කුධරාවර' නම් ද්‍රවිඩ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන බැව් රාඝවන් පෙන්වා දෙයි (Rggavan, 141-142). ඔවුන්ගේ නිජ භූමිය ආන්ද්‍රාවයි. වාග් වේදීන්ගේ මතය වන්නේ 'අණ්ඩර දෙමළ' යන්න 'ආන්ධ්‍රා' යන සංස්කෘත පදයෙන් බිඳී 'අණ්ඩර' ලෙසට සැදුණු බවකි. නොතේරෙන ද්‍රවිඩ භාෂාවක් වූ තෙලිගු බස හැඳින්වීමට 'අණ්ඩර දෙමළ' යන්න සිංහලයන් යෙදූ උපහාසාත්මක නාමයකි."කුරාවර්" අතර ප්‍රධාන ප්‍රභේද දෙකකි. එනම් නයි නටවන්නන් හා රිළවු නටවන්නන් යනුවෙනි. ලංකාවේ අහිගුණ්ඨිකයෝද මේ වෘත්තීන් දෙකෙහිම නියැළෙති (ධර්මදාස, 1985 :662).

තෙලිගු භාෂාවේ සැලැස්ම, රටා සමුදාය හෙවත් ව්‍යාකරණය මෙන්ම භාෂා සංස්පර්ශය තුළින් සිදුව ඇති විෂමතා සහිත තත් භාෂාවේ ස්වභාවය යම්තාක් දුරට හඳුනාගනිමින් අවබෝධ කරගත් අපට ඔවුන්ගේ ජන ජීවිතයේ අභ්‍යන්තරය එනම් ආර්ථික, සංස්කෘතික හා සමාජ ලක්ෂණ ඔවුන් වහරන බසින්ම වටහා ගත හැකිය.

සමාජීය සිරිත් විරිත්, රැකී රක්ෂා, කර්මාන්ත, ආගමික ජීවිතය, ඇදහිලි විශ්වාස පද්ධතිය හා ජනකවි, ජනකථා, ජන ගී ඇතුළත් ජන සාහිත්‍ය රටින් රටට ජාතියෙන් ජාතියට කුලයෙන් කුලයට විවිධ වේ. වෙනස් වේ. ලොව ඕනෑම රටක සංස්කෘතිය හැඩවැඩ වන්නේ අනන්‍යතා පිලිබිඹු වන්නේ මෙකී විශේෂතා හේතුවෙනි. මෙලොව එළිය දකින්නට පෙර සිටම සකස් වුණු සිරිත් විරිත් ශ්‍රී ලාංකේය තෙලිගු ජන සංස්කෘතියටද එක් කරන්නේ සංස්කෘතික අනන්‍යතාවකි. වර්තමානය වන විට ශ්‍රී ලාංකේය අභිගුණ්ඨික ජනයෝ විවිධ සමාජ ප්‍රවණතාවන්ට නතුවෙමින් ජීවත් වෙති. උක්ත තත්ත්වය හමුවේ ඔවුන් වහරන තෙලිගු බසද ව්‍යවහාරයෙන් බැහැර වෙමින් පැවතීම නොවැළැක්විය හැකි සාධකයකි. ඊට සමගාමීව ඒ හා බද්ධ වූ සමාජ, ආර්ථික පසුබිම මෙන්ම අනන්‍ය වූ සංස්කෘතික ලක්ෂණ ද අතුරුදහන් වෙමින් වියැකී යන බැවින් එම සමාජ සංස්කෘතික ලක්ෂණ ඔවුන් වහරන බසින් හඳුනාගැනීම ඉතා වැදගත් වේ.

විශ්ව කෝෂයට "භාෂාව" යන ශීර්ෂය යටතේ නිර්වචනයක් සපයන ජෝර්ජ් එල්. ට්‍රෙගර් "භාෂාවක් නම් මිනිසුන් සමාජ සමූහයක (ප්‍රජාවක) සාමාජිකයන් ද, සංස්කෘතියක කොටස්කරුවන්ද වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා හා සන්නිවේදනය සඳහා යොදාගන්නා සම්මුතික (ආර්පිතාර්ථික) වූ වාග් සංකේත පද්ධතියක් බව කියයි. (බලගල්ලේ , 1945 : 1, 2) **(Language is a system of arbitrary vocal symbols by means of which human beings as member of a social group and participation in a culture, intract and communicates) (Encyclopaedia Britanica: 1963)** ඉන්දියාවේ සිට පැමිණි තෙලිගු වාසීන් එකී ජන සමාජයේ සංස්කෘතික ලක්ෂණ ලංකාව තුළ එක් පැත්තකින් තහවුරු කිරීමට උත්සහ ගෙන ඇත. ඒ නිසාම මහා සංස්කෘතිය තුළ උප සංස්කෘතික ඒකකයක් (Sub Culture Unit) (පල්ලොල් පිටිය, 2010) බවට අද ඔවුන් පත්වී තිබේ.

තෙලිගු ජන වහරින් නිරූපණය වන සමාජ සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීමේ පළමු පියවර වශයෙන් තෙලිගු ජනවහරේ සැලැස්ම, රටා සමුදාය, වියරණ ලක්ෂණ මෙන්ම භාෂා සංස්පර්ෂය වැනි කරුණු කෙරෙහි අපේ අවධානය යොමු කළ යුතුය. එමඟින් භාෂාවේ යථා ස්වභාවය පිළිබඳ මනා චිත්‍රයක් අප සිත් තුළ ඇඳ ගත හැකිය. මෙය මැනවින් වටහා ගත හැක්කේ සිංහල භාෂාවත් සමඟ තුලනය කිරීම මගිනි.

- සිංහල භාෂාවේ නාම පදවල බහු අර්ථය හැඟවීම සඳහා යොදා ගන්නා 'ලා' යන්නට තෙළිඟු භාෂාවේ ඇත්තේ 'ර්' යන්නයි.

| සර්වනාමයේ දී | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙළිඟු ව්‍යවහාරය |
| තුඹලා | මීර් |
| මෙයාලා | වීර් |
| එයාලා | වාර් |
| ඔක්කොමලා | අන්දූර් |

- නාමපදයේ දී අගට 'ලා' යන්නත් ක්‍රියාපදයේ දී අගට 'තා' යන්නත් 'තාර්' යන්නත් යෙදා ගැනීම විශේෂ ලක්ෂණයකි.

| ක්‍රියා පදයේ දී | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙළිඟු ව්‍යවහාරය |
| ගහනවා | මොත්තුතා |
| අඬනවා | එර්තා |
| කනවා | තින්තා |
| බොනවා | තාගතා |
| යනවා | පාතා |
| නටනවා | අඩතර් |
| කියනවා | හඩතර් |
| පුස්තර් | බලනවා |
| තග්ගතර් | හිනාවෙනවා |

- පැල වර්ග සෙට්ටු' වන අතර පළා වර්ග 'කූර්ග්' නමින් හැඳින්වේ.

| පැළ වර්ග | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙළිඟු ව්‍යවහාරය |
| බටු පැළ | වගකයි සෙට්ටු |
| තක්කාලි පැළ | ටක්කාලි සෙට්ටු |
| වී පැළ | ඔඩිල් සෙට්ටු |
| මිරිස් පැළ | හැර්නායි සෙට්ටු |

| පළා වර්ග | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙළිඟු ව්‍යවහාරය |
| ගොටුකොළ | ගොටුකූර්ග් |
| තම්පලා | තම්මකූර්ග් |
| මුකුණුවැන්න | මුකුණුවැන් කූර්ග් |
| කංකුං | කංකුං කූර්ග් |

සිංහල හා ද්‍රවිඩ නොවන මොවුන්ගේ භාෂාව අණ්ඩර දෙමළයක් වන්නේ අනෙකක් නිසා නොව එකී මිශ්‍ර භාවය නිසා බව අවබෝධ කරගැනීම එතරම් උගහට නැත.

- සිංහලයේ වර්ණ යන්න පාට නමින් හැඳින්වුවද ඔවුන් එය වහරන්නේ 'ෆාටා' වශයෙනි.

| වර්ණ භාවිතයේදී | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙලිඟු ව්‍යවහාරය |
| සුදු පාට | තැල්ල ෆාටා |
| කහපාට | තහ ෆාටා |
| කොළ පාට | ඇග් ෆාටා |

හෙළ බස හා තෙලිඟු බස සම්මිශ්‍රිතව සකස්වන වදනින් පෝෂිත තෙලිඟු වහරින් ලැබෙන්නේ චමත්කාරජනක ආස්වාදයකි. චමත්කාරය විසිතුරුභාවය බසට එක් කරන්නේ ආලෝකයකි. අපේ 'ශෙඩ්' තෙලිඟු ජනයාට 'කයා' වන්නේ පෙර කියමන තවත් තහවුරු කරමිනි.

| එළවළු වර්ග | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙලිඟු ව්‍යවහාරය |
| වට්ටක්කා | ගුටකයා |
| වැටකොළු | වැටකොළුකයා |
| මුරුංගා | මුක්කයා |
| බෝංචි | බෝංචිකයා |
| බටු | වන්කයා |
| කෝස් | කෝස්කයා |
| දොඩම් | දොඩම්කයා |
| ඇපල් | ඇපල්කයා |
| බෙලි | බෙලිකයා |

රටා සමුදාය හෙවත් ව්‍යාකරණයෙන් පමණක් නොව භාෂා සංස්පර්ශය තුළින් ද තෙලිඟු වහර පෝෂණය වී තිබීම තවත් විශේෂ ලක්ෂණයකි. පාලි සංස්කෘත භාෂා මෙන්ම ද්‍රවිඩ ඉංග්‍රීසි, පෘතුගීසි. ලන්දේසි. වැනි භාෂාවල බලපෑම ද හෙළ භාෂාවේ පෝෂණයට හේතු වූවා සේම තෙලිඟු වහරින් ද එබඳුම ස්වරූපයක් දක්නට ලැබේ.

| භාෂා සංස්පර්ශය | |
|---|---|
| **සිංහල ව්‍යවහාරය** | **තෙලිගු ව්‍යවහාරය** |
| පෑන | ෆාදනා |
| පොත | ෆොතා |
| බෑගය | බදක් |
| මකනය | මකනා |
| පැන්සල | ෆැන්සලා |
| සීනුව | බැල්ලෙක |
| ක්‍රීඩා පිටිය | ඇල්මඩ පිටියා |
| රටහුණු කැල්ල | සුන්නම් කුරා |
| පුටුව | ෆුටුවි |
| බස් | බස්සු |
| බයිසිකල් | බස්කැල් |
| කාර් | කාර් |
| වෑන් | වැන් |

තෙලිගු භාෂාවේ සැලැස්ම, රටා සමුදාය හෙවත් වියරණය මෙන්ම භාෂා සංස්පර්ශය තුළින් භාෂාවේ ස්වභාවය යම්තාක් දුරට හඳුනාගත් අවබෝධ කරගත් අපට ඔවුන්ගේ 'ජන ජීවිතයේ ඇතුළාන්තය එනම් සමාජීය, ආර්ථික, සංස්කෘතික ලක්‍ෂණ ඔවුන් වහරන බසින්ම වටහා ගැනීමට මෙතැන් සිට උත්සහා ගනිමු. ඒ අනුව

1. සමාජීය සිරිත් විරිත්
2. රැකි රක්‍ෂා හා කර්මාන්ත
3. ආගමික ජීවිතය හා ඇදහිලි විශ්වාස පද්ධතිය
4. ජනකවි ජනකථා ඇතුළත් ජන සාහිත්‍ය
5. සමාජ සංවිධාන හා නීතිරීති

## *සමාජීය සිරිත් විරිත්*

ඉන්දියාව මුල් භූමිය වූ අභිගුණ්ඨික ජනයා පෙර'පර දෙදිගට සංක්‍රමණය වී ලොව පුරා ඒ ඒ සමාජ ප්‍රවණතාවන්ට අනුව හැඩගැසී සිටින නමුත් ඔවුන් සතු පොදු අනන්‍ය සංස්කෘතික ලක්ෂණ රාශියක් තවමත් දක්නට ලැබීම විශේෂත්වයකි. ලාංකේය අභිගුණ්ඨික ජනයා සාමූහික ගෝත්‍ර වශයෙන් ජීවත් වන අතර ඔවුන්ගේ ගෝත්‍රික දිවිය තුළින් විනිවිද පෙන්වනුයේ ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවයි.

රටින් රටට ජාතියෙන් ජාතියට කුලයෙන් කුලයට සිරිත් විරිත් විවිධ වේ වෙනස් වේ. ලොව ඕනෑම රටක සංස්කෘතිය හැඩවැඩ වන්නේ අනන්‍යතා පිළිබිඹු වන්නේ මෙකී සිරිත් විරිත්වල පවතින විශේෂතා හේතුවෙනි. උපතට පෙර සිටම සකස් වුණු සිරිත් විරිත් තෙලිගු ජන සංස්කෘතියටද එක් කරන්නේ සංස්කෘතික අනන්‍යතාවකි.

### *ගැබ් පෙළහර*

ගැබ් පෙළහර හෙවත් ජාත කර්ම ඈත අතීතයේ සිට පැවත එන චාරිත්‍රයකි. ඒ අනුව *'බඩ් පුට්ටුකාරි'* හෙවත් ගර්භනී කාන්තාව අප සමාජයට මෙන්ම ඔවුන්ටද සුවිශේෂ වූ තැනැත්තියකි. දූලි රැවුල්, කොණ්ඩා නොකපා මෙම සුවිශේෂී භාර්යාව රැකබලා ගැනීම ස්වාමි පුර්ෂයා සතු පරම යුතුකමකි. ස්වාමියා කොණ්ඩා රැවුල් කැපීම අංග විකල දරුවන් ලැබීමට මෙන්ම දරුවා ලැබෙන අවස්ථාවලදී මිය යාමටද තදබල හේතුවකි. ස්වාමි පුරුෂයාගේ දැඩි රැකවරණය අවධානය ඇයට ලැබිය යුතුය.

*'සින්න බිට'* එනම් ළදරුවා ලැබුණු දින *තංකයා* (පොල්) ගෙඩියක් පලා එහි වතුර මවට දෙන අතර **සුමකයා** (දෙහි) කපා කිරිදරුවා පිටස්තරයන්ට නොපෙන්වා දින 7ක් සඟවා තැබේ. *සර්වා* (සරම) හෝ *කීටැ* (චීත්තය) එනම් පිරිමි ළමයෙක්ද ගැහැණු ළමයෙක්ද යන්න බැලීමේ චාරිත්‍රය සිදුවන්නේ ඉපදී දින හතකින් (7) පසුවය. මෙම සියලු කටයුතු පිටුපස සිටින්නී *'මුට්ටදූරය අම්මාය'*. අපේ භාෂාවෙන් නම් ඇය වින්නඹු මාතාව හෙවත් රිදි නැන්දාය. මවට එරෙන මුල්ම කිරි කඳුළ *'යකඩ කිරිය'* එය ළදරුවාට විෂය. බීමට දීම තහනම්ය. එය දොවා තුඹසකට දැමීම සිරිතයි. *'සන්නිකුමාර'* යනු වැදූගෙයි සන්නියයි. එය වැළඳුනු මවට හිසමත වරා කොළ තබා ඒ මත ඉදෙන බත් හැළියක් තැබීමෙන් *සන්නිකුමාර අමාරය* (රෝගය) සුවකළ හැකිය. උපන්නේ පිරිමි දරුවෙක් නම් නැකත් සුභ වේලා නොබලා නාඩේ නායකයා *ආගමන්නා, ජලිලෝඩා, අනවත්තු* යන නම්ද ගැහැනු දරුවෙක් නම් *ඇගටක්කා, හල්ලක්කා, මසක්කා, තිම්ටක්කා* යන නම් ද තැබීම සිදුකරයි.

### *'පැද්ද හයින් බිච්චි' මංගල්ලය (මල්වර මංගල්ලය)*

*'පැද්ද හයින් බිච්චි'* මංගල්ලය (මල්වර මංගල්ලය) සිරිත් විරිත් රාශියකින් සමන්විත වුවකි. පැද්ද හයින් බිච්චි තරුණිය ගෙයින් පිටමං කොට *තේරිමාං* (දං) *නාලමාන්* (පලු) *නිකමාන්* (නික) *පාවට්ටමාන්* (පාවට්ටා) කොළවලින් සැකසූ *ග-රුසෙ* (පැලක) *සින්නබිඩ* (තනියට සිටින කුඩා ගැහැණු ළමයා) සමග දින 5ක් තැබිය යුතුය. මෙම දින පහ ඇතුළත රැහේ සියලූ දෙනා කෑම බීම දී ඇයව පෝෂණය කළ යුතුය. පස්වන දින උදෑසන යක්ෂ ප්‍රේත කිළි දෝෂ නිවාරණ යක්කංකාරියකි. මල්වර කිල්ල නිවාරණය මෙහි අරමුණයි. කළුකුමාර, කළු යකා වෙනුවෙන් සිදුකරන මෙකී ශාන්ති කර්මයට රතු, සුදු, කහ, කලු යන වර්ණවලින් බත්ගුලි 20 ක් *"කෝඩි"* හෙවත් "නාබර කුකුළෙක්" *කෝඩි ගුඩ්ඩු* එනම් බිත්තරයක් *පසුහීල්* හෙවත් කහදියර පිදේනිය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ වේ. නාඩේ ගුරාගේ උපදෙස් මත සිදුකරන මෙම ශාන්ති කර්මයේදී කුකුළාගේ බෙල්ල කපා ලබාගත් රිරිද සිව් වර්ණයේ යුතු බත් ගුලිද බිත්තරයද කළු යකා විෂයෙහි පුදා මල්වර යෞවනිය සියලූ දෝෂ වලින් ඉවත් කළයුතුය.

මල්වර දෝෂය වැළඳුණු යෞවනියට මිස මල්වර වූ සියලු යෞවනියන්ට මෙබඳු කංකාරියක් සිංහල සංස්කෘතිය තුළ දක්නට නැත. මල්වර වීමෙන් පසුව මසකට වරක් මාස් ශුද්ධිය සිදුවන සෑම දිනකම එම තරුණිය සිය පවුලේම සියලු දෙනාගෙන් වෙන්ව ගෙතුළට නොපැමිණ ගෙමිදුලේ පැදුරක් එළා එහි වාසය කළ යුතුය. සුව වූ පසු කහ දියර ගා පිරිසිදු වී ගෙතුළට පැමිණිය යුතුය. මෙබඳු පිරිසිදු තත්ත්වයක් ඇගෙන් අපේක්ෂා කළද බාහිර වශයෙන් නම් එබදු තත්ත්වයක් අපට දැකගත නොහැකිය.

*'තැල්ලපුල් මල් කර්තව්' හෙවත් තැලි පැළඳවීමේ මංගල්ලය*

*වද නා* (නෑනා) *බාවර්දි* (මස්සිනා) ගේ මංගල්ලය තෙලිගු ජන සමාජයේ නීති ගතවුවකි. වේලා පත්කඩ බැලීමක් හෝ සුභ නැකත් කිසිවක් නැති මෙම මංගල්ලයෙන් *'තැල්ලපුල් මල් කර්තව්'* හෙවත් තැලි පැළඳවීමෙන් මංගල්ලේ කටයුතු වාමිව සරලව නිමාවට පත්වේ. පෙර සමාජයේ තම වර්ගයා අතරම ආවාහ විවාහ සිදුකළ ද දූන් දූන් තම වර්ගයෙන් බැහැරවද අතිනත ගැනීම් සිදුවන බවත් සිරිත් විරිත් අතර සම්මිශ්‍රණයක් සිදුවී ඇති බවත් කුඩාගම් නායක නඩරාජගේ අදහසයි.

අහිගුණ්ඨික ජන සමාජයේ තහනම් යැයි සම්මත විවාහයක් (තම වර්ගයෙන් පිට කෙනෙකු සමඟ විවාහවීම වැනි) සිදු කළවිට දිව පිච්චීමේ දඬුවම දෙනු ලැබේ. වරද කළ (තහනම් විවාහය කළ) දෙදෙනා වරිගසභාව අභියසදී කරේ මල් මාලා දමා පොල් ගෙඩියක් හා බුලත් කොළයක් ගෙන දෙකට කඩා ඔවුන්ගේ දිව මත තබා දිව පිච්චීම සිදු කරයි. එහිදී ඔවුන්ට නොයෙක් උසුලු විසුලු ගැරහුම් හා නින්දාවන්ට ලක් වීමට සිදුවේ. මෙම දඬුවම් ක්‍රම මගින් තම වර්ගයාගේ සංස්කෘතික අනන්‍යතාව හා කුල දූෂණය වලක්වා ගතහැකි බැව් ඔවුන්ගේ අදහසයි.

වරිගයේ දෙදෙනෙක් අතරේ අනියම් සබඳතාවක් ඇති බවට වරිගයේ ප්‍රධානියාට ආරංචි වුවහොත් ඔහු මුලින්ම කරනුයේ වරිගයේ සියලු දෙනාම කැඳවා නඩුව විනිශ්චය කිරීමය. එහිදී ඔවුන් වැරදිකරුවන් වුවහොත් මිනිසෙකුට ඉසිලිය නොහැකි ලොකු ගලක් (බරක්) ගෙනත් දෙදෙනාගේම කරමතින් තබා එය ඔසවාගෙන උක්ත ස්ථානයේ වට හතක් ගමන් කළ යුතු ය. මෙහිදී රැස්ව සිටින අය අසභ්‍ය වචන කියමින් බැණ අඬ ගසමින්, වරිගයේ ඇත්තෝ ඔවුන්ට නොයෙක් දේ දමා ගසමින් හිරිහැර කරති. එම බර වැටුනහොත් ඔවුන්ට පහරදීම සඳහා උල් ලී තබාගෙන තවත් පිරිසක් ඔවුන් වටා ගමන් කරති. යම් කෙනෙක් එම බරින් මිදෙන්නේ නම් ඔහුට හෝ ඇයට එම වට හත ගමන් කරන තුරු ගුටිබැට වලට මුහුණ දීමට සිදුවේ.

### *'සච්චිනිල්ලු' නොහොත් අවමංගල්ලය*

සමාජ සිරිත් විරිත් අතර *'සච්චිනිල්ලු'* නොහොත් මළ ගෙදර ද විශේෂ අවධානයට යොමුවිය යුතුය. අපට මිනී පෙට්ටි තිබුණද ඔවුන්ට එබන්දක් නැත. ඔවුන් *'සච්චි නෝර්'* එනම් මළ මිනිය *'සච්චි නොනු මැස්සම් ද පෙට්ට'* නමින් හැඳින්වෙන දඬු මැස්ස උඩ *'සාපයක්'* පැදුරක් එළා සුදු රෙද්දකින් ඔතන ලද 'සච්චි නෝර්' තැන්පත් කර තබා ටික වේලාවකින් ඔවුහු *'උල්කි කුන්වල්'* නම් වූ සොහොන් වළට ගෙන ගොස් දමති. මෙම ප්‍රාථමික ජන කණ්ඩායම් හි අනන්‍ය සාධාරණ සමාජ සංස්කෘතික සාර ධර්ම, සිරිත් විරිත් නූතන සමාජ ප්‍රවණතා සමඟ මුසුව ඇකී මැකී වියැකී යමින් පවතී. ඔවුන් සතු සංස්කෘතික අනන්‍යතාව පොදු ජන සමාජ නව ප්‍රවණතාවන්ට හසුව ඇති බව ඇතැම් සමාජ සිරිත් විරිත් හුදු වචන මාත්‍රයට පමණක් සීමාවී තිබීමෙන් මොනවට පැහැදිලි වේ.

### *සමාජ සංවිධාන හා නීති රීති*

ඔවුන්ගේ නීතිය ගෝත්‍ර නීතියයි. ඒ වගේම පවුල් දහය, දෙළහ බැගින් කණ්ඩායම් වශයෙන් බෙදී සංවිධානය වී සිටීම දක්නට ලැබේ. වර්තමානයේ විවිධ වෙනස්කම් පැවතිය ද ඔවුන්ගේ ගෝත්‍ර නීතිරීති වලට හා සම්ප්‍රදයන්ට ඔවුන් දක්වන්නේ පුදුමාකාර සැලකිල්ලකි. අහිගුණ්ඨිකයන්ගේ කුඩාම ශ්‍රේණියේ නායකයා ***පෙරියමුනියන්*** වන අතර ඔහුගේ නීතිය කණ්ඩායමේ නීතියයි. පෙරියමුනියන් අපක්ෂපාතී නායකයෙකු වන අතර ඔහුගේ නීතිය සියලු දෙනාම පිළිගනිති. ඔහු වගකීමෙන් සහ සාමකාමීත්වයෙන් යුක්ත පුද්ගලයෙක් වනවා සේම තමන්ගේ කණ්ඩායම මනාලෙස පාලනය කරන්නෙක් ද වේ.

ඔහු කිසියම් අවස්ථාවකදී අපක්ෂපාතී නොවන්නේ ද, වගකීම් පැහැර හරින්නේ ද, අයතා ගනුදෙනු සිදු කරන්නේ ද එවිට ඔවුන්ට පිහිට වන්නේ ***කුලවේරියන්*** ය. කුලවේරියන් යනු කුඩා ශ්‍රේණි කිහිපයක් එකතු වී සෑදුණු මහා ශ්‍රේණියක (පළාතක) නායකයා ය. තම ගෝත්‍රයේ නීති රීති වටා, වගකීම් වටා කොතරම් යුක්තිගරුකව රොක් වී සිටිනවාද කිවහොත් කුලවේරියන් වෙත යන්නේ ඉතාම කලාතුරකින් බව ඔවුන්ම පවසන්නේ මහත් ආඩම්බරයෙනි.

ඉතා උසස් යැයි සම්මත සමාජවලට අයත් අයතා, දූෂණ, නීති විරෝධී ක්‍රියා දෙස බලද්දී අද්‍යතනයේදී පවා තත් නොදියුණු ජනතාව තම ගෝත්‍රයේ නීති රීති හා සම්ප්‍රදයන් යුක්තිගරුක දේවල් ලෙස සැලකීම පුදුම සහගතය. අහිගුණ්ඨික සමාජයේ මිනිසුන් අතීතයේ සිටම පහත් ගති පැවතුම්වලින් යුතු අය වූ නිසා ඔවුන් අතර පැවති උදාර පරිපාලන ව්‍යුහය යටපත්වී තිබුණද දැනුදු ආදර්ශයට ගතයුතු බොහෝ දෑ ඒ තුළ පවතින බව පෙන්වා දිය යුතුමය. එකී පරිපාලන ව්‍යුහයට අයත් දඬුවම් ක්‍රම ද ඉතාම

දැඩි ස්වභාවයක් ගත්තද වර්තමානයේ දී එම දඬුවම් ක්‍රම යම් පමණකට ලිහිල් වී ඇත.

සරල විනෝදකාමී දිවිපෙවතක් ගත කරන මොවුහු ගෝත්‍රික නීති රීති මඟින් පාලනය වෙති. අතීතයේ දී පවුල් දහය දොළහ කණ්ඩායම් වලට බෙදී ස්වාධීන කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වූ අතර කණ්ඩායමේ පොදු එකඟතාවය නීතිය වූ අතර, කණ්ඩායම් නායකයාගේ තීරණය අවසාන තීරණය වේ. වැදගත් තීන්දු තීරණ ගන්නේ *"දර්බාර්"* මඟිනි. දර්බාර් යන්නෙන් රැස්වීම හැඳින්වේ. කණ්ඩායම් නායකයාගේ තීරණය පිළිගැනීමට මැළි වේ නම් ගෝත්‍රික නායකයා වන *"තලෛවර්"* වෙත යා යුතුය. සෑම අහිගුණ්ඨික කුප්පායමක් තුළම දැඩි සංවිධානයක් ඇතිවා සේම ශ්‍රී ලංකාව පුරා විසිර වසන අහිගුණ්ඨික කුප්පායම් අතර ද සංවිධානයක් ඇත. කුමන පළාතක විසිර සිටිය ද එක කුප්පායමක විස්තර කීමට අනෙක් කුප්පායමේ අය දනිති.

දීපවාලි සමයෙහි ශ්‍රී ලංකාවේ වෙසෙන සෑම අහිගුණ්ඨික කුලයක්ම ඔවුන්ගේ ගෝත්‍ර මූලස්ථානය වන කැකිරාව අසල පිහිටි කච්චිදූව නම් ස්ථානයට වසරක් පාසා එක්රැස් වෙති. තම ගෝත්‍රයට බලපාන පොදු ප්‍රශ්න සියල්ල නිරාකරණය කරගන්නේ මේ සම්මේලනයේ දීය. එසේම එහිදී කුල අතර කෙරෙන ආවාහ විවාහ ගිවිසුම් පිළිබඳව සම්මුතිවලටද එළඹීම කෙරේ. මිල මුදල් හා වෙනත් ගනුදෙනු පිළිබඳ තීරණ ගැනීම ද ඉදිරි වර්ෂයේ එක් එක් කුප්පායමේ ගමන් මාර්ගය ආදිය ගැන කතිකා කර ගැනීම ද තවත් අරමුණකි.

අතීතයේ දී කණ්ඩායම් වශයෙන් බෙදී වරිගනායකයකු වටා සංවිධානය වී සිටි අහිගුණ්ඨිකයෝ වර්තමානයේ දී මහා සමාජ සංස්කෘතික ප්‍රවණතාවන්ට නතු වෙමින් දිවිගෙවති. තම වරිග සාමාජිකයන් 214 කින් යුත් සුභසාධන සංගමයක් පිහිටුවීමට කුඩාගම අහිගුණ්ඨිකයන් සමත් වීමෙන් ඒ බව මැනවින් තහවුරුවේ.

- අවමඟුල් අවස්ථාවක දී සහය ලබා දීම.
- ක්‍රීඩා කටයුතු සඳහා සහාය ලබා දීම. (අම්ල ක්‍රීඩා සමාජය නමින් ක්‍රීඩා සමාජයක් ද පවතී)
- ආගමික කටයුතු සඳහා සහාය ලබා දීම.
- සුභ සාධක කටයුතු සඳහා සහාය ලබා දීම.
- අධ්‍යාපන කටයුතු සඳහා සහාය ලබා දීම සිදු කෙරේ.

ප්‍රදේශයේ අනෙකුත් සමිති සමාගම් හා සම තත්ත්වයට ඔවුන් අද වන විට පැමිණ තිබේ. උක්ත සුභ සාධක සංගමය මේ වන විට ලියාපදිංචි සංගමයක් බවට පත් කරගෙන තිබීම සැලකිල්ලට ගතයුතු කාරණයකි.

## *රැකී රක්ෂා හා කර්මාන්ත*

වෙනත් කිසිදු ශ්‍රෝතික ජන කණ්ඩායම්වල දක්නට නොලැබෙන රැකියාවන් හා කර්මාන්තවල මොවුහු නිරත වෙති. මෙකී වරිගකාරයන් සතුව පවතින පාරම්පරික දැනුම මේ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇත.

- *පාම්බු ආර්තවර්* - නයි නැටුම
- *කෝහිතුල් ආර්තවර්* - රිලා නැටුම
- *සේතුම්සු සෝඩු / සෙයිසුස්නාවි* / කස්තිරම
- මලයාලම් ගුරුකම්
- කෘෂිකර්මාන්තය
- ධීවර කර්මාන්තය

මොවුන්ගේ මෙම ජීවනෝපායන් හා කර්මාන්ත පාදක කොටගෙන තෙළිඟු ජනවහර හැඩවැඩවී පෝෂණය වීමද අප කිසිසේත්ම අමතක නොකළ යුතුය. නයා, නයිහාමි, නොහොත් *'පාම්බු'* පොදු සමාජයට භයානක විෂඝෝර සර්පයෙකි. එහෙත් මොවුනට සරල ජීවනෝපායකි. *පාම්බු ආර්තවර්* මුදල් උපයන ස්ථිර රැකියාවකි. *'පාම්බු පෙට්ටියට'* නයෙක් හුරුකර ගැනීම, නැටුමට පුරුදු පුහුණු කිරීම ඉතා දුෂ්කර කටයුත්තකි. ඒ සඳහා මනාවූ පුහුණුවක්ද *'නසරා'* නොහොත් නයි නලාව හැසිරවීමේ මනා පුරුද්දක් ද පැවතිය යුතුය. නයින් දෂ්ඨ කරන සෑම වාරයකටම නයිවිෂ නසන *'දූෂ'* එනම් විෂ නයිගල ඔවුන්ට නැවත ජීවිතය ලබාදෙන මහා ඖෂධයකි.

නයින් පොළඟුන් මෙන්ම රිළවුන්ගේද විවිධ රංගනයන් පොදු ජනතාව ඉදිරියේ රඟ දක්වීම ඔවුන්ට ආවේණික වූ තවත් ජීවනෝපායකි. හරක් බලාගැනීම, රජ කාලේ උල තැබීම, මඟුල් කපුකමේ යාම යනාදී රංගනයන් ඒ අතර විශේෂ තැනක් ගනී. *'සේතුම් සුසෝඩු' 'සෙයිසුන්කවී'* නමින් හැඳින්වෙන සාස්තර කීම තෙළිඟු ජනයා අතර ප්‍රචලිත තවත් විජ්ජාවකි. මෙය විජ්ජාවක් වශයෙන් හැඳින්වූයේ අනුන්ගේ සිත් සතන් වික්ෂිප්ත කිරීම මෙම රැකියාවේ සුවිශේෂ ලක්ෂණයක් වන බැවිනි. ජන්මයෙන්ම දායාද වූ එකී ශක්තිය දිවි තරකර ගැනීමට මහෝපකාරී වන්නකි.

රොඩී ජනයා මෙන්ම තෙලිඟු ජනයාද යන්ත්‍ර මන්ත්‍ර මෙන්ම මලයාලම් ගුරුකම්වලට උපන් හපන් කමක් ඇත්තෝ වෙති. වෙළඳ වශී, මිත්‍ර වශී, පෙම් වශී, නෑදෑ වශී, ආදි වූ වශී ගුරුකම් මෙන්ම විවිධාකාරයේ හඳි හූනියම් ද යන්ත්‍ර මන්ත්‍ර ද ඔවුන්ට ආවේණික වූ ජීවනෝපායකි. දිවි තරකරගන්නා මලයාලම් වශී මන්ත්‍රයක් පහත සඳහන් වේ.

'හද්‍රකාලි සිමත් ද පුඩ්යුම
අයිරත් ද පුඩියුම සිතිපුර
කල්පුම යක් පුහි හිර කාස්ත්‍රම
කායුම එක් එක් බුසුම
පුඩ්ඩු මත්තිඩයුම අරිතඩ
තෙත්පුම සිබසැර හද්‍රකාලි
හිර හිර නමං'

වර්ණ තුනකින් යුත් පුංජමකට (මලකට) මෙම මන්ත්‍රය 21 වතාවක් නොකඩවා කීමෙන් තම අභිමතාර්ත සාර්ථක වීම ඔවුන්ගේ විශ්වාසයයි.

පරම්පරාවෙන් උරුම වූ ඉහත සඳහන් ජීවනෝපායන්ට අමතරව පරම්පරාවෙන් උරුම නොවුවද නූතන අභිගුණ්ඨීක සමාජයේ කෘෂිකර්මාන්තයද තවත් එක් ජීවනෝපයක් වශයෙන් පෙන්වාදිය හැකිය. සෑම ජීවනෝපායකින්ම ඔවුන්ගේ ජීවිත පෝෂණය වන්නාසේම ඔවුන් වහරන බසද පෝෂණය වීම විසිතුරු වීම විශේෂ අවධානයට යොමුකළ යුත්තකි. කෘෂිකර්මාන්තය හා බැඳි ජන වහර තෙලිගු ජනවහරට එක් කරන්නේ අපූර්වත්වයකි. සේන, කමතා පොදුවහරට යම් සමානකමක් දැක්වුවද අනෙක් වදන් අවබෝධ කරගැනීමට තෙලිගු ජනවහර අධ්‍යයනයට ලක්කළ යුතුය.

| කෘෂිකර්මාන්තයේ | |
|---|---|
| සිංහල ව්‍යවහාරය | තෙලිගු ව්‍යවහාරය |
| කුඹුර | මල්ලු |
| හේන | සේන |
| කමත | කමතා |
| උදැල්ල | සත්තෑ |
| පොරව | ගොඩිල් |
| පිහිය | මස්කි |
| පෝරුව | බුර්ද ගුත්තා |
| පිදුරු | ඔඩිල් කසුම් |
| ජලය | නීල |
| වැට | කල්ල |
| නියර | ගෙනවැ |
| පිදුරු | ඔඩිල් කසුම් |
| ජලය | නීල |
| වැට | කල්ල |
| නියර | ගෙනවැ |

## *ආගමික ජීවිතය හා ඇදහිලි විශ්වාස පද්ධතිය*

පොදු සමාජයට මෙන්ම ඔවුන්ටද ඇදහිලි විශ්වාස පද්ධතියක් ඇත. *යගමේස්සාමි, කනපම්මාසමි* ඔවුන්ගේ දෙවිවරුන් අතර ප්‍රධාන වේ. *පච්චවාගම්, කුංචවාගම්, බදනලාගම්, නැම්ප්ලාගම්* ආගම් අතුරින් කිහිපයකි. උණට වෛද්‍ය ප්‍රතිකාර කිරීම දේව කන්නලව්වකින් යක්ෂ දෝෂ මඟහැරීම ඒ අතර දැකිය හැකිය. කළුකුමාර දෝෂය, *කච්චකුමාර් සාමිගෙන්* ඇතිවන්නකි. *කතරගම්සාමි, මුත්තසරම් සාමි, සවුල්ගමුක්කු* නම් කිරීම එනම් වැදීම, ඇදහීම, රෝග සුවවීම සෘජුවම බලපායි. යක්ෂ දෝෂ වලින් මිදෙන්නට *'බිල්ලා ලේනිකි ඉන්ටාර් සම්පිකර්'* එනම් දොල පිදේනි පුදදිය යුතුය. දොල පිදේනි පුදලීමේදී ආතුරයාට *'කෙණ්ඩි'* එනම් කුකුළාට පයින් ගැසිය යුතුය. ලෙඩරෝග සමනය වන්නේ පයින් ගැසීමෙන් පසුවය. එමෙන්ම රෝගියාට *'පසුනීල්'* සාත්තු කළ වතුර ද ඉසිය යුතුය. යම් කෙනෙකු බියට පත් කල්හි කහ සුදු කළු වර්ණිත බත් ගුලි තුනක් ගෙන සියලු දෝෂ හරණය වන්නේ යැයි සිතා ආතුර හිසවටා හත්වරක් කැරකීම විශේෂ පූජාවකි. අනතුරුව ඒ මත කහ දිය ඉස පන්දම් තබා ආතුරයා ඊට උඩින් පැන යා යුතුය. එවිට දෝෂය දුරු වේ.

ඇස්වහ, කටවහ, හෝවහ දුරු කිරීම සඳහා ද අභිගුණ්ඨික ජනතාව අතර අභිචාරාත්මක ක්‍රම දැකිය හැකිය. ඇස් වහ දුරු කිරීම සඳහා ලුණු කැට, ගම්මිරිස් ඇට , අඟුරු කැබලි , පොල් අතු කැබලි තුන බැගින් ගෙන ගින්නට දමා එහි දුම් ආතුරයාට ස්පර්ෂ වීමට සැලැස්වීමෙන් ඇස්වහ දුරුවෙන බව ඔවුහු විශ්වාස කරති.

උදරාශ්‍රිත රෝගයකින් තම වරිගක්කාරයෙක් පීඩා විඳින්නේ නම් ගොම ස්වල්පයක්, ලී කැබලි, වම් කකුලේ මහපට ඇඟිල්ලේ නිය කොටසක්, ඇහිබැමක රෝමකූප , පොල් තෙලින් පෙඟවූ සුදු රෙදි කෑබලි උපයෝගී කරගනිමින් තත් අභිචාර ක්‍රමය ආරම්භ කරයි. දියබඳුනකට එක්කළ ගොම මත ලී කැබලි තුන රදවා දවන ලද එක් එක් රෙදි කැබැලි ලී මතට එක්කර නැවුම් මුට්ටියකින් වසනු ලැබේ. වැසූ මුට්ටිය වමතින් ස්පර්ෂ කර සූර්ය නමස්කාරය කිරිම අරහයි. අනතුරුව සූර්ය දිශාවට පූජා ද්‍රව්‍ය සහිත මුට්ටිය තෙවරක් කරකවා වතාවත් හමාර කිරීමෙන් රෙදි කැබලි අළු ආතුරයාගේ වමතේ සහ වම් පාදයේ මහපට ඇඟිලි මත තවරා භාජනයේ ඉතිරිය නොපෑගෙන තැනකට දමනු ලැබේ. මෙකී අශිචාරය වරු තුනක් සිදු කිරීමෙන් උදරාබාධ සමනය වන බැව් ඔවුන්ගේ විශ්වාසය යි.

## *තෙලිඟු ජන සාහිත්‍ය*

තෙලිඟු ජන සංස්කෘතිය විනිවිද පෙන්වන ගාමක බලවේගය අනෙකක් නොව ඔවුන්ටම අනන්‍ය වූ ජන සාහිත්‍යයි. ජන ගී, ජනකතා, ජන කාව්‍ය,

නැළවිලි ගී, ප්‍රස්ථා පිරුළු, ජන නැටුම් ඔවුන්ගේ 'දරු නැළවිලි ගී' පාරම්පරිකව පැමිණ එන මොවුන්ටම උරුම වූ අවෛතික ජන සාහිත්‍යයකි.

*දුරි දුරු නා බංගරේ අම්මා*
*හිකත්තට හින්දර වච්චි*
*පංඩිගේ නමා බංගරේ අම්මා*
*අම්මා පෙතිඩ්පා*
*පූපකණ්ඩිගේ බංගරේ අම්මා ....*
*කට්ටෙකි සුසැ කට්ට තීල් දගිරි*
*පුට්ටෙකි සුසැ පුට්ටතීලේ දගිරි*
*අබ්බබ්බා බුත්සු කෙලා මත්දු උණ්ඩදි*
*මක්කකරිට්ලැ පරිසුණ්ඩි*
*සෝ බාගතේ*

යනුවෙන් තෙලිඟු බසින් ඔවුන්ට වැටහෙන මෙම පද යම්බදු රිද්මයකට ගැයෙන බව නම් අපට සිතා ගත හැකිය. පාරම්පරිකව පැවත එන ලිඛිත ජන සාහිත්‍යයක් හෝ ජන නැටුම් සම්ප්‍රදායක් ඔවුන්ට නොමැති වුවද ***කාවඩි එත්තදමින්*** නමින් හැඳින්වෙන ජන නැටුම් සාම්ප්‍රදායක් මෙන්ම ***'තප්පු'*** නමින් හැඳින්වෙන බෙරනද සම්ප්‍රදායක් ද දැකගත හැකිය. 'කතරගම් සාමි' වෙනුවෙන් වාර්ෂිකව පැවැත්වෙන කතරගම් මහා මංගලයේදී නැටුම් ගැයුම්වලින් සමන්විත වූ තෙලිඟු පෙරහැරක් පැවැත්වීම මෙම වරිගක්කාරයන්ගෙන් නොවරදවා සිදුකෙරන සිරිතකි.

### *නිගමනය (Conclution)*

මානව සංස්කෘතියේ අනන්‍යතාව රැකී පවතින්නේ එකී සංස්කෘතිය සතු ප්‍රතිමාන හෙවත් ධර්මතා පද්ධතිය මතය. මෙකී ප්‍රතිමානයන් (Norms) සැකසෙන්නේ සාරධර්ම (Value) පාදක කොටගෙන බැවින් මානව සංස්කෘතිය සම්බන්ධයෙන් සිදුකෙරන ඕනෑම පර්යේෂකයෙකුට සාරධර්ම (Value) පිළිබඳ පරිඥානය අත්‍යවශ්‍ය වේ. එකී සාරධර්ම පරිඥානය සංස්කෘතිය ඇගැයීම නොව මානව චර්යා, සමූහ චර්යා අවබෝධය විෂයෙහි සෘජුවම බලපාන ප්‍රබල කරුණක් බව පෙන්වාදිය හැකිය. මෙම සමාජ සංස්කෘතික ප්‍රතිමානය ශ්‍රී ලාංකේය තෙලිඟු ජන සංස්කෘතිය අධ්‍යයනයේදී බෙහෙවින්ම ඉවහල් කරගත හැකිය. තෙළිඟු ජන සංස්කෘතියේ සැබෑ සමාජ සංස්කෘතික යථාර්ථය ඔවුන් ව්‍යවහාරිත භාෂාවෙන් හා සාහිත්‍යයෙන් සුවනයවන හෙයින් ඔවුන් සතු විවිධ සමාජ සංස්කෘතික චර්යා පිළිබඳ මැනවින් අවබෝධ කරගත හැක.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References)*


ආරියරත්න,සුනිල්. (1992). ජෝන්ද සිල්වා නාට්‍ය එකතුව, ද්විතිය භාගය, කොළඹ : එස්. ගොඩගේ සහ සහෝදරයෝ .

ජාතක පොත් වහන්සේ . (2007). කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධර්මදාස, කේ.එන්.ඕ.(1985). *"අහිගුණ්ඨික ජනයා"* මහවැලිවංශය 2 කාණ්ඩය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

බෂාම්, ඒ.එල්. (1965). අසිරිමත් ඉන්දියාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

බලගල්ලේ, විමල් ජී. (1995). භාෂා අධ්‍යනය හා සිංහල ව්‍යවහාරය, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බණ්ඩාර, තිබ්බරයාගම සහ තවත් අය. (2007). ජනවිවිධත්වය, මහරගම : රාවය පබ්ලිකේෂන්.

මුනිදාස, කුමාරතුංග. (2002). (සංස්) ගිරා සංදේශ විවරණය, කොළඹ:එස්.ගොඩගේ සහ සහෝදරයෝ .

සිංහල දීක් සඟිය. (1998). බුද්ධ ශාසන අමාත්‍යාංශය.

සෝමසුන්දර, දයානන්ද. මාදහ-බණ්ඩාර, හේරත්. (2004). ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන සමාජ, කොළඹ: එම්.ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත, වැලිවිටියේ. (1963). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, (ප්‍රථමභාගය), කොළඹ: අභය මුද්‍රණාලය.

රණවීන, ඇඩ්වින් .(1938). (සංස්) කුන්ස්තන්තිනු හටන, කොළඹ: එම්.ඩී ගුණසේන සහ සමාගම.

රණසිංහ, චන්ද්‍ර ශ්‍රී. (1972). අහිගුණ්ඨික ජනකථාව, කොළඹ:ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

රණසිංහ, චන්ද්‍ර ශ්‍රී. (2003). ලොව පැතිර වසන අහිගුණ්ඨිකයෝ, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ .

**Encyclopaedia Birtannica.**(1978). 15 editions Vol 7, Chicago: He; em Hemingway Benton.

Raghvan, M.D. (1965). **The Ceylon gipsi tribe**, Wthnologinl Surver of leulon, No 4, **Ahikuntakaya**

Tylor, Edward B. (1929). **Primitive Culture**, Vol I, London: Jonh Murray.

**සම්මුඛ සාකච්ඡා**

කුඩාගම් අහිගුණ්ඨික නායක නඩරාජා සමඟ 2009. 08.02 දින ඔහුගේ නිවසේ දී කළ සාකච්ඡාව.

එම්.මසක්කා, වයස අවු 55 යි, කුඩාගම, 2009. 08. 02, දින නිවසේ දී කළ සාකච්ජාව.

එස්.ඇගටන්නා, වයස අවු 53, කුඩාගම, 2009. 08 .03, දින නිවසේ දී කළ සාකච්ජාව.

එස්. අනවත්තු, වයස අවු 62, කුඩාගම, 2009.08.03, දින නිවසේ දී කළ සාකච්ජාව.

**ඡායාරූපාවලිය**



මියගිය රැහේ නායකයා වෙනුවෙන් භෝජන කැපකිරීම



මියගිය රැහේ නායකයාට පුදපූජා පැවැත්වීම





මියගිය අහිගුණ්ඨික නායකයා උදෙසා රැහේ සාමාජිකයන්ගෙන් පිදෙන දානය



කුඩාගම නයිනටවන අහිගුණ්ඨිකයෝ



මල්වර දැරියන් රැඳවීමට සාදා ඇති පැල



ගුබ්බෑයමක් ඉදිරිපස සිටින අහිගුණ්ඨිකයෝ



රිලව් නටවන අහිගුණ්ඨිකයෝ